## 3. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම.

01) I.මෙරට පැරණි ජන සමාජයේ පහතින් දැක්වෙන නායකයින් හඳුන්වන්න.

(A) පවුලක ප්‍රධානි
(B) ගමක ප්‍රධානි
(C) වැව් පද්ධතිය භාර ප්‍රධානියා

II. පණ්ඩුකාභය රජතුමාගෙන් සිදු වූ සේවාවන් දෙකක් සඳහන් කරන්න.

III.ගමක ප්‍රධානියා විසින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් සඳහන් කර ඉන් එකක්

කෙටියෙන් සඳහන් කරන්න.

IV.දුටුගැමුණු රජතුමාගේ දේශපාලන හා ආගමික සේවාව උදාහරණ සහිතව විස්තර කරන්න.

02) I.පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප භාවිතා කළ රජවරුන් පිළිවෙළින් නම් කරන්න.

(A) නරේශ්වර
(B) අලකපය මහ රජු
(C) කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ

II.අතීතයේ රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ වූ පහත දැක්වෙන නිළධාරීන් එකල හැඳින් වූ නාමයක් සඳහන් කරන්න.

(A) මහ ඇමති

(B) භෝජන ශාලා අධිකාරී

(C) නගර පරිපාලක

(D) රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී

03) I.පියාගෙන් පුතාට හා සහෝදරයාගෙන් සහෝදරයාට රජකම උරුම වූ බවට උදාහරණ එක බැගින් ලියන්න.

II.වසභ රජතුමාගෙන් සිදු වූ සේවාවන් තුනක් සඳහන් කරන්න.

04) සොළීන්ගෙන් රට නිදහස් කර ගත් මහා විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාව අගයන්න.